# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1978/4 - 2016 අගෝස්තු මස 01 වැනි සඳුදා - 2016.08.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2016

**1972 අංක 7 දරන ගෙවල් කුලී පනත**

1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 2 වන වගන්තියේ 5 වන උපවගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 43 වන වගන්තිය යටතේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සජිත් ප්‍රේමදාස,
නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

2016 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ උපලේඛනය, එහි 4 වන අයිතමයට ඉක්බිතිව ම පහත අයිතම එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"5. යම් ස්ථානයක ගෙහිමියා, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ හෝ පළාත් සභාවේ යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් හෝ, රජය, රාජ්‍ය සංස්ථාවක්, පොදු අධිකාරියක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන විට, එම ස්ථානය මේ පනතේ කාර්යය සඳහා බැහැර කරන ලද ස්ථානයක් විය යුතු ය.

6. යම් ස්ථානයක කුලී නිවැසියා, පළාත් පාලන ආයතනයක්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ හෝ පළාත් සභාවේ යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් හෝ රජය, රාජ්‍ය සංස්ථාවක්, පොදු අධිකාරියක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන විට, එම ස්ථානය මේ පනතේ කාර්යය සඳහා බැහැර කරන ලද ස්ථානයක් විය යුතු ය.".

2. 2003 සැප්තැම්බර් මස 09 දිනැති අංක 1350/17 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

08-396


1A - PG 3036 — 307 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*